www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ න්‍යෂ්ටික කටයුතු පිලිබඳ ආයතනය, එක්සත් ජනපදය හා ඉරානය

**The UN nuclear agency, the US and Iran**

පීටර් සිමන්ඩ්ස් විසිනි

2010 පෙබරවාරි 25

ඉරානයට එරෙහිව තවත් වටයකින් එක්සත් ජාතීන්ගේ සම්බාධක පැනවීම සඳහා ඔබාමා පරිපාලනය සිය රාජ්‍ය තාන්ත්‍රික මෙහෙයුම උත්සන්න කිරීමට සමගාමීව, ජාත්‍යන්තර පරමානුක බලශක්ති ආයතනය (අයිඒඊඒ) විසින් පසුගිය සතියේ නිකුත් කරන ලද වාර්තාවකින් ටෙහෙරානය, න්‍යෂ්ටික අවි පිලිබඳ එහි හැකියාව වර්ධනය කරන බවට එක්සත් ජනපදය විසින් ගෙන යන ප්‍රචාරයට කැපී පෙනෙන තල්ලුවක් ලබා දී තිබේ.

පිටු 10 න් සමන්විත මෙම වාර්තාව, අයිඒඊඒ විසින් කලින් නිකුත් කර තිබෙන විස්තරවල සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබෙන තවත් පිටපතක් වුවත්, එහි අවධාරනයේ මූලික වෙනසක් ඇතිව තිබේ. "විභව හමුදා මානයන්"" යන හිසින් යුතු ඡේද හයකින් සමන්විත කොටසෙහි මෙය කැපී පෙනෙයි. න්‍යෂ්ටික අවියක් නිපදවීමට සම්බන්ධ පරියේෂන ඉරානය විසින් 2004 වසරින් ඔබ්බට ද ගෙනයන්නට ඇතැයි යන " උත්සුකය" අයිඒඊඒ විසින් මෙහි දී ප්‍රථම වතාවට විවෘතව මතු කලේය.

ඉරානයට එරෙහිව තව තවත් දන්ඩන පියවර ගැනීමේ එක්සත් ජනපද සැලසුම් සාධාරනී කරනය සඳහා මෙම වාර්තාව යොදාගෙන තිබේ. නිදසුනක් ලෙස "ඉරානය න්‍යෂ්ටික මිසයිල් හිසක් ගොඩනඟා ඇති බව පරීක්ෂකවරු කියති" යන ශීර්ෂයෙන් යුතු ලිපියකින්, හෙලිදරව් නොකරන ලද අතීත හෝ වර්තමාන "න්‍යෂ්ටික කටයුතු" පිලිබඳ පුලුල් සාක්ෂි අයිඒඊඒ සතුව තිබුනු බව *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය ප්‍රකාශ කලේය. 2003 දී ඉරානය සියලු න්‍යෂ්ටික අවි පරියේෂන නතර කල බවට, 2007 අග භාගයේ එක්සත් ජනපද බුද්ධි අංශ කරගත් ජාතික බුද්ධි අංශ තක්සේරුව (එන්අයිඊ) මඟින් ඉදිරිපත් කල නිගමනය මෙම අයිඒඊඒ වාර්තාවෙන් බන්ධනයවී ඇති බව ද ලිපියේ සඳහන් විය.

අයිඒඊඒ වාර්තාවේ "අසුබ පුවත් බොහොමයක්" අඩංගුවූ බව පෙබරවාරි 20 දින *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතේ කතුවැකියෙන් කියවුනි. ඉරානය විසින් සුපෝෂනය කරන ලද යුරේනියම් නිපදවීම හා අවි පරියේෂන පවත්වාගෙන යාමේ හැකියාව ගැන අයිඒඊඒ දක්වා ඇති උත්සුකය ගැන ද කතුවැකිය අවධාරනය යොදා තිබුනි. "තාක්ෂනික මෙහෙවර යුක්ති යුක්තව ක්‍රියාත්මක කරමින් කරුනු කාරනා අවංකව ම වාර්තා කිරීම ගැන සහතික වීම" පිලිබඳව එහි නව ප්‍රධානී යුකියා අමානෝට කතුවැකියෙන් ප්‍රශංසා කර තිබුනි. ඉරානය බෝම්බයක් පසුපස දිවීම පිලිබඳව තමන් දැන සිටි සියලු දේ වාර්තා කිරීමෙන් "අයිඒඊඒ වලක්වාලීම හා පැහැදිලි නිගමන වලට පැමිනීම ප්‍රතික්ෂේප කිරීම" පිලිබඳව හිටපු ප්‍රධානී මොහමඩ් අල් බරාඩෙයි ට පුවත්පත තදින් දොස් නැගීය.

මෙම ප්‍රකාශවල පැහැදිලි අරමුන වන්නේ, ඇමරිකානු මාධ්‍යයේ වඩාත් වියරු සහගත කොටස් පොදුවේ ස්ථිර ලෙස ප්‍රකාශ කරන කරුනු කාරනා තුලින්, ඉරානය රහස්‍ය න්‍යෂ්ටික අවි වැඩ සටහන් මත ඉදිරියට පියවර ගනිමින් සිටින බවට පවතින බිය තීව්‍ර කිරීමයි. එහෙත් ඉරාන න්‍යෂ්ටික අවි වැඩ සටහන් පිලිබඳ අලුත් සාක්ෂි අයිඒඊඒ වාර්තාවට ඇතුලත් වූයේ නැත. "වත්මන්" පරියේෂනයක් ගැන කිසිදු සාක්ෂියක් එහි අඩංගුවූයේ ද නැත. ලියවිල්ලේ අවධාරනය වෙනස් වීමට බොහෝ දුරට හේතු වූයේ කරුනු පිලිබඳ උත්සුකයන් නොව, නියෝජිත ආයතනයේ අධ්‍යක්ෂ වරයා වෙනස් වීමයි. යථාර්තය නම්, ඉරානයේ න්‍යෂ්ඨික වැඩ සටහන් පිලිබඳ ප්‍රශ්නය මුල්කොටගෙන අයිඒඊඒ කෙතරම් දුරකට දෙශපාලනීකරනය වී තිබේ ද යත්, එහි තාක්ෂනික යයි දැක්වෙන වාර්තා පවා තියුනු අභ්‍යන්තර බෙදීම් අවුස්සාලීමට හේතුකාරක වී තිබීමයි.

මාධ්‍ය තුලින් 2007 වසරේ එක්සත් ජනපද බුද්ධි තක්සේරුව හා එල් බරාඩෙයි ඉලක්ක කිරීම අහම්බ සිද්ධියක් නොවේ. එන්අයිඊ නිමකරන ලද්දේ බුෂ් පාලන තන්ත්‍රය විසින් ටෙහෙරානයට එරෙහි සිය ව්‍යාපාරය කැලැත්තීමත් සමග ය. එමඟින් බුෂ් පාලන තන්ත්‍රයේ බිය ගෙන දෙන චෝදනා පලදායී ලෙස සිදුරු කලේය. මෙම තක්සේරුව ක්ෂනිකවම, ඊස්රායලයේ හා එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ මිලිටරිවාදී කොටස්වල දැඩි විවේචනයට ලක් විය. 2003 වසරේ ආක්‍රමනයට පෙරාතුව, ඉරාකය සතුව න්‍යෂ්ටික වැඩ

සටහන් නොතිබූ බව ප්‍රකාශ කරමින් බුෂ්ගේ මුසාවාද වලට ප්‍රතිවාදී අදහස් පලකිරීම පිළිබඳව එදා සිටම එල් බරාඩෙයි එක්සත් ජනපදයේ දැඩි විරුද්ධත්වයට ලක්ව සිටියේය.

ඉරානයේ න්‍යෂ්ටික වැඩ සටහන් පිළිබඳව අයිඊඊඒ තුල දේශපාලන කන්ඩායමික ගැටුම් යොමුවුනේ "ප්‍රකාශිත අධ්‍යයනයන්" ලෙස හැඳින්වූ දෑ වෙතය. එනම්, න්‍යෂ්ටික පිපිරීමක් ඇරඹීමට යොදාගන්නා වර්ගයේ අධි පිපිරීම් ශක්තියෙන් යුත් ද්‍රව්‍ය වලින් කෙරෙන පරියේෂනවල සිට බෝම්බයක් සඳහා නියුට්‍රෝන පනගැන්වීම හා මිසයිලයක් සඳහා න්‍යෂ්ටික පිපිරවීමේ හිස පිළිබඳ අධ්‍යයනයන් දක්වා පරාසයක අනේක විධ කටයුතු මෙයට ඇතුලත් වෙයි. ඉරානයේ න්‍යෂ්ටික අභිප්‍රායන් ඔප්පු කිරීමට ඇති සාධක ලෙස බටහිර මාධ්‍යයන්හි නිරන්තරව උපුටා දක්වන මෙම අධ්‍යයනයන්ට අදාල ප්‍රධාන කාරනය වන්නේ, ඒවා "කියනු ලබන" අධ්‍යයනයන් වීමයි. මෙම "කියනු ලබන අධ්‍යයනයන්" ගොතන ලද ඒවා බව ටෙහෙරානය දැඩි ලෙස ප්‍රකාශ කර තිබුනි.

සැබවින්ම "සාක්ෂිවලින්" බොහොමයක් සපයා ඇත්තේ, ඉරානයේ අභිප්‍රාය බෝම්බයක් සෑදීම යයි " ඔප්පු කිරීමේ" ඕනෑකමින් පෙලනු බුද්ධි නියෝජිත ආයතන විසිනි. - ඒවා බොහෝකොට ම එක්කෝ ඊස්රායල නැත්නම් ඇමරිකානු හෝ යුරෝපීය ආයතන වීමට ඉඩ තිබේ - මේ ප්‍රකාශ බොහොමයක් පදනම් වන්නේ, ඉරානයෙන් හොර රහසේ පිට කරන ලද ලැප්ටොප් පරිගනකයක තිබී සොයාගන්නා ලදැයි කියනු ලබන ලිපිලේඛන මතය. මෙම ප්‍රකාශ පලමු වරට හෙළිදරව් කරන ලද්දේ, 2005 වසරේදීය. එක්සත් ජනපදය මෙම පරිගනකය අයිඊඊඒ සංවිධානයට බාරදී නැති අතර ලියවිලි කිසිවක් ප්‍රසිද්ධියට පත්කිරීමට ඉඩදී ද නැත.

මේ රහස්‍ය තොරතුරුවල සැක සහිත ස්වභාවය සැලකිල්ලට ගනිමින් එල් බරාඩෙයි ඒවා අයිඊඊඒ වාර්තාවලට ඇතුලත් කිරීම ප්‍රතික්ෂේප කලේය. ඔහුගේ මතයට එක්සත් ජනපදය හා යුරෝපීය බලවතුන් පමනක් නොව අයිඊඊඒ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් ඔලී හෙයිනොනෙන් පවා විරෝධය දැක්වීය. වාර්තාවන පරිදි ඔහු, ඉරානය විසින් ක්‍රියාත්මක කරන ලදැයි කියන න්‍යෂ්ටික අවි පරියේෂන විස්තර කෙරෙන ලියවිල්ලක් ප්‍රසිද්ධියට පත්කරන ලෙස බලකර සිටියේය. "ඉරානයේ න්‍යෂ්ටික වැඩ සටහනේ විභව මිලිටරි මානයන්" යන හිසින් යුතු අයිඊඊඒ හි පිටු 67 න් සමන්විත අභ්‍යන්තර වාර්තා කෙටුම්පතකින් උපුටාගත් කොටස් ජාත්‍යන්තර මාධ්‍යයට රහසිගතව ලබාදී තිබුනි. සක්‍රීය න්‍යෂ්ටික බෝම්බයක් සෑදීම සඳහා ප්‍රමානවත් තොරතුරු ටෙහෙරානය සතුව ඇති බවට ප්‍රකාශයක් එමගින් ඉස්මතු කරන ලදී.

ප්‍රසිද්ධියට පත්කරන ලද්දේ එම ලියවිල්ලෙන් සීමිත කොටසක් පමනි. විස්තර සහිත තොරතුරු සොයාගත හැක්කේ එක්සත් ජනපදය තුල මුල් බැසගත්, විද්‍යාව හා ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ ආයතනයේ (අයිඑස්අයිඑස්) වෙබ් අඩවියෙන් ය. තොරතුරු බොහොමයක් ලැබුනේ බෙහෙවින් ප්‍රසිද්ධියට පත්කරන ලද ලැප්ටොප් පරිගනකයෙන් බව එහි සඳහන් වේ. එවන් පරිගනකයක් නොතිබීමටත් ඉඩ ඇතැයි ද තිබුනත් එය ඉරානය තුල ඇමරිකානු සම්බන්ධයක් හෝ සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහා ඇමරිකානු රහස් තොරතුරු නියෝජිත ආයතන විසින් ගොතන ලද්දක් පමනක් වීමටත් ඉඩ ඇතැයි යන අදහස අයිඑස්අයිඑස් ඉදිරිපත් කරයි. ලැප්ටොප් පරිගනකයේ නියම ස්වභාවය කුමක් වුවත්, එහි අඩංගු ලියවිලිවල සත්‍යතාව ඔප්පු කර නැති අතර ඉරානය න්‍යෂ්ටික අවි සාදන බව ඔප්පු කිරීම සඳහා සත්තකින්ම ඒවා සාක්ෂි බවට පත් නොවේ.

අයිඊඊඒ අධ්‍යක්ෂ වශයෙන් එල් බරාඩෙයි වෙනුවට තම අවශ්‍යතාවලට නතුකරගත හැකි අයෙක් පත්කර ගැනීම සඳහා පසුගිය වසර තුල එක්සත් ජනපදය හා එහි මිත්‍ර පාර්ශවය දැරූ උත්සාහය අවසානයේදී සාර්ථක විය. ප්‍රවෘත්ති විශ්ලේෂක පීටර් ලී විසින් ටයිම්ස් පත්‍රයේ පලකරන ලද ලිපියකට අනුව, "ඡන්ද විමසීම් හයකින් හා දිගින් දිගට සිදුවූ බලපෑම් වලින් පසුව 2009 ජූලි මාසයේ දී, එල් බරාඩෙයිගේ දාර්ශනික අනුප්‍රාප්තිකයා සේ සලකන ලද අපේක්ෂකයා වූ දකුනු අප්‍රිකාවේ අබ්දුල් සමාඩ් මින්ට්, බටහිර රටවල වඩා මනාප තේරීම වූ ජපානයේ යුකියා අමානෝ අතින් පරාජයට පත්විය."

ජාත්‍යන්තර සාමය සඳහාවූ කාර්නගී පුන්‍යායතනයේ ජේම්ස් ඇක්ටන් මෙසේ ප්‍රකාශ කල බව එම ලිපිය උපුටා දැක්වීය. "ඉරානය පිළිබඳ වාර්තා ගැන අමානෝ, වඩා දැඩි ආකල්පයකින් කටයුතු කරනු ඇතැයි එක්සත් ජනපදය මෙන්ම බොහෝ සංවර්ධිත ජාතීන් විශ්වාස කිරීම නිසා එම රටවල් අමානෝට සහාය දැක්වූහ..." පසුගිය සතියේ පලවූ වාර්තාවන්ට අනුව අමානෝ, අපේක්ෂිත පරිදි කටයුතු කර ඇතැයි අනුකූලත්වය පලකරන කතුවැකියකින් වොෂින්ටන් පෝස්ට් වාර්තා කලේය. නව අයිඊඊඒ අධ්‍යක්ෂ වරයා එම සැක සහිත රහස්‍ය තොරතුරු, "පුලුල්" ලෙස පමනක් නොව, "තාක්ෂනික විස්තර සම්බන්ධයෙන් වඩා ස්ථිරසාරව මෙන්ම විශ්වාසනීය ලෙසත් ඉදිරිපත්කර තිබේ."

ලබාගත හැකි ප්‍රසිද්ධ තොරතුරු අනුසාරයෙන් බලන කල රහස්‍ය න්‍යෂ්ටික වැඩ සටහන් ඉරානය සතුව නොමැති බව බැහැර කල නොහැකිය. න්‍යෂ්ටික බෝම්බයක් නිපදවීමට ඉරාන තන්ත්‍රය දරන ඕනෑම ප්‍රයත්නයක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* නිරනුමාන ගර්හාවට ලක්වන බව මීට පෙර අපි පෙන්වාදී

ඇත්තෙමු. එමඟින් ඉරාන වැඩකරන ජනතාව අධිරාජ්‍යවාදී ප්‍රහාරයක් හමුවේ ආරක්ෂා නොකරනවාක් මෙන්ම එවැනි ප්‍රහාරයක අනතුර තීව්‍ර කිරීමට පමනක් එය තුඩුදෙන බවත් අපි පෙන්වාදී ඇත්තෙමු. ඉරාන ධනපති පන්තියේ න්‍යෂ්ටික අභිප්‍රායන්හි ඉලක්කය වන්නේ, සිය කලාපීය තත්වයට එමගින් තල්ලුවක් ලබාගැනීමයි. එය අනිවාර්යයෙන්ම මගපාදනු ඇත්තේ ජාතික තරගකාරීත්වයන් ගැඹුරු කිරීමටත්, තව තවත් ගැටුම්වලටත් ය.

එසේ වුවත්, එක්සත් ජාතීන් හරහා ඉරානයට වඩාත් දැඩි දඬුවම් පැමිනවීමේ එක්සත් ජනපදය ප්‍රමුඛ ව්‍යාපාරයත් න්‍යෂ්ටික අවි ගැටුමක් වලක්වා ලීමත් අතර මෙලොව සම්බන්ධයක් ඇත්තේ නැත. එක්සත් ජනපදයේ හැසිරීම අතිශයින්ම කුහකය. න්‍යෂ්ටික කටයුතු දිරිමත් නොකිරීමේ ගිවිසුමට අත්සන් තබා ඇති ඉරානයට සම්බාධක හා මිලිටරි ප්‍රහාර එල්ල කිරීමට තර්ජනය කරන අතර තුර ගිවිසුම අත්සන් තැබීම පවා ප්‍රතික්ෂේප කරන ඉන්දියාව, පකිස්ථානය හා ඊශ්‍රායලය වැනි සිය සගයන් න්‍යෂ්ටික බෝම්බ ගොඩගසා ගැනීම කෙරෙහි ඔබාමා පාලන තන්ත්‍රය අනුගමනය කරන්නේ නිහඬ පිලිවෙතකි.

වොෂින්ටනයේ ප්‍රධාන අරමුන වන්නේ, ඉරානයේ ද මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ ද බලශක්ති සම්පත් අතින් පොහොසත් කලාපවල සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට වඩාත් නතුකරගත හැකි පාලන තන්ත්‍රයක් ටෙහෙරානය තුල ඇටවීමයි. ඔබාමා තන්ත්‍රය ඉරානය මත ක්‍රමානුකූලව සිය පීඩනය දැඩි කරමින් සිටියි. ඉරාන විප්ලවකාරී හමුදාව යටතේ ඉරානය තුල "මිලිටරි අඥාදායකත්වයක්" ක්‍රියාත්මකව ඇතැයි පසුගිය සතියේ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් අලුත් තානයකින් ප්‍රකාශ කලාය. මෙම වාචාලත්වයෙහි පැහැදිලි එල්ලය වූයේ, එක්සත් ජනපද අවශ්‍යතාවන්ට අනුකූලවන ආකාරයේ "පාලන තන්ත්‍ර වෙනසක්" ක්‍රියාවට නැගීම සඳහා විප්ලවකාරී හමුදාවට එරෙහිව ඉරානය තුල විරෝධතාවන්ට අනුබල දීම ය.

මේ සතියේ ක්ලින්ටන් ලතින් ඇමරිකාවේ සංචාරයක යෙදේ. සෙනේට් සභාවට ප්‍රකාශ කල පරිදි ඇයගේ රාජ්‍යතාන්ත්‍රික න්‍යායපත්‍රයේ යලි වතාවක් ඉහලින්ම ඇත්තේ ඉරානය යි. ඉරානයට සම්බාධක පැනවීමේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාවකට සහාය ගොනුකර කර ගැනීමත්, මැද පෙරදිග හා අනෙකුත් කලාපවල එක්සත් ජනපද සන්ධාන තරකර ගැනීමත්, සිරියාව වැනි ඉරානයේ මිත්‍ර පාක්ෂිකයන්ට යටින් වල කැපීමත් අරමුනු කර ගත් රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුමක ක්ලින්ටන් මූලිකත්වය ගෙන සිටියි. පෙබරවාරි 24 දින ඇයගේ ප්‍රකාශයකට අනුව, රුසියාව සමග ඇති කර ගත් "ඉමහත් ප්‍රගතිය" හා චීනය පිලිබඳව ලබාගෙන තිබෙන වර්ධනය ගැන ක්ලින්ටන් උදම් ඇනුවාය. එජා ආරක්ෂක මන්ඩලයේ නිෂේධ බලය උසුලන සාමාජිකයන් අතරින් ඉරානයට අලුතින් දඬුවම් පැමිනවීමේ උත්සාහයට වඩාත්ම විරෝධය දක්වන රට චීනය යි.

ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ වාඩිලාගැනීම් හා පකිස්ථානය විවෘත සිවිල් යුද්ධයක් කරා තල්ලු කිරීම තුල දැනටමත් පටලැවී සිටින ඔබාමා පාලනාධිකාරය, ඉරානයට එරෙහිව සාහසික පිලිවෙතකට අවතීර්න වී සිටියි. මෙය, කලාපය පුරා ආතතීන් උත්සන්න කිරීමටත්, තවත් ගැටුම් හා යුද්ධ පිලිබඳ අන්තරායන් ඉහල නැංවීමටත් පමනක් හේතු සාධක වනු ඇත.

© www.wsws.org